

# ඉස්සර වගේ නෙවෙයි.. දැන් වගකීම් වැඩියි..

## පැතුම් තිලකසිරි





පසුගිය දවසක මට පැතුම් තිලකසිරි හමුවුණේ පුංචි සිඟිත්තියකුත් සමගින්. පැතුම් දැන් වගකීම් හිසේ දරාගත්ත තාත්තා කෙනෙක්. ඔහුගෙ සිඟිති දියණිය නදිති නටාෂා. පැතුම්ගෙ බිරිඳ ඩිනාලි ජයසේකරත් ඔහු සමගින්ම හිටියා.

**ශ්‍රීනාත්**
ඉතින් කොහොමද පැතුම්
**පැතුම්**
සුපුරුදු වැඩ රාජකාරි ටික කරමින් සතුටින් ඉන්නවා. පරිබාහිර වැඩ වලට වඩා දැන් වැඩි කැපවීමක් කරන්න වෙලා තියෙන්නෙ දුව ගැනයි. දැන් වගකීම් වැඩියිනෙ. දරුවකු ලැබුණාම දෙමාපියන්ට දැනෙන සතුට ගැන අහලා තිබුණත් අත්දැකීමෙන් ලැබුණාම තමයි ඒක හරියටම තේරුම් ගත්තෙ. නැවත ඉපදීමක් වගෙයි.

**ශ්‍රීනාත්**
ඔබ කලින් කියලා තිබුණා නැවත ඉපදීම ලැබුණේ නිවේදන කටයුතු වලින් කියලා. දැන් ඒවයින් ඈත් වෙලා ද?
**පැතුම්**
නෑ නෑ .. ඒවායින් ඈත් වෙලා නැහැ. ඒ විවාහ වෙන්න ඉස්සෙල්ලා. විවාහ වෙලා දරුමල්ලො ලැබුණාම ඒවා වෙනස් වෙනවා.

**ශ්‍රීනාත්**
අපි පොඩ්ඩක් ඒ ගැන කතා කරමු ද? පාසල් ජීවිතේ ගැන.
**පැතුම්**
මම මුලින්ම පාසල් ගියේ මහර කුමාර විද්‍යාලයට. එතනින් ශිෂ්‍යත්වය සමත් වෙලා කොළඹ රාජකීය විද්‍යාලයට ආවා. මගේ සියළුම වෙනස් වීම් සිදුවුණේ රාජකීය විද්‍යාලයේදී තමයි.

**ශ්‍රීනාත්**
නිවේදන කටයුතු වලට ආවේ කොහොමද?
**පැතුම්**
මම පොඩි කාලේ ඉඳන්ම ගෙදරදී එක එක ආකාරයේ නිවේදන කටයුතු පවුලේ අයට ඇහෙන්න කරනවා. ඉතින් ඒ අය ඒකට මට හැම තිස්සෙම උදව් කළා. දහම් පාසලේ පාසලේ සමිතියේ මම හැමදාම නිවේදන කටයුතු කළා. ඊට පස්සෙ රාජකීය විද්‍යාලයේ ගුවන් විදුලි සංගමයට බැඳිලා ගුවන් විදුලි තාක්ෂණ ශිල්පියකු හැටියට මුලින්ම වැඩ කළා. අගෝස්තු නිවාඩු කාලය වන විට අපේ ගුවන්විදුලි සංගමය මාසයක් පමණ ගුවන් විදුලි වැඩසටහනක් විකාශනය කරනවා. මෙහිදී හර්ෂණ මාතරආරච්චි කයන මගේ මිත්‍රයෙක් මාව නිවේදන කටයුතු වලට ඇදලා ගත්තා. එතැන් පටන් පාසලේ බොහෝ නිවේදන කටයුතු වලට සහ ගුවන් විදුලියට සම්බන්ධ වෙලා වැඩ කළා.

**ශ්‍රීනාත්**
ඔස්ට්‍රේලියාවේ ගුවන් විදුලියට සම්බන්ධ වුණේ කොහොමද?
**පැතුම්**
ඒක වුණේ අහම්බෙන්. 1999 මම මෙහෙට ආවාම රාත්‍රියේ වැඩට යනවා. ඔහොම වැඩ ඇරිලා එන වෙලාවක අහම්බෙන් රේඩියෝ එක කරකවනකොට සිංහල වැඩ සටහනක් ඇහුණා. සිංහල සින්දුවක් ඇහුණාම මට ලොකු සතුටක් ඇතිවුණා. සිංහල සින්දුවක් ඉල්ලන්න කැමැත්ත තිබුණත් දුරකතන ඇමතුම් අංකය නොදන්නා නිසා ඒක කරන්න බැරි වුණා. ඔහොම දවස් කීපයක් අහනකොට එක දවසක දුරකතන අංකය කිව්වා. මම ඒකට කතා කළා. කතා කරලා සින්දුවක් ඉල්ලුවා. මට අද වගේ මතකයි සමිතා මුදුන්කොටුවගේ කෙළොම්පුරේ ගීතය තමයි ප්‍රචාරය කළේ. මම ඊට පස්සෙ මේ දුරකතන අංකයට කතා කරලා මේ වැඩසටහනට සම්බන්ධ වන්න ආසා බව දැන්නුවා. ඒ අනුව රවි කරව්දෙණිය මහතා මට එන්න කියා ආරාධනා කළා. මම ඒ මහතාට ඒගැන ස්තුතිවන්ත වෙනවා. එයින් පස්සෙ දිගටම ත්‍රී ට්‍රිපල් ඉසෙඩ් ගුවන්විදුලියට සම්බන්ධව හිටියා.

**ශ්‍රීනාත්**
මුලින්ම ප්‍රසාංගික වේදිකාවට නිවේදකයෙක් ලෙස ගොඩ වුණේ කො-හොමද?
**පැතුම්**
ඩැන්ඩිනොන් ධම්මදීප භාවණා මධ්‍යස්ථානයට ආධාර පිණිස 1999 සංගීත ප්‍රසංගයක් පැවැත්තුවා. එයට අනුලා බුලත්සිංහලත් රොහාන් ශාන්ත බුලේගොඩත් සහභාගි වුණා. මේ ප්‍රසංගයේ නිවේදන කටයුතු කරන්න කියලා මට හරේෂ් අබේගුණවර්ධන ආරාධනා කළා. එතනින් පටන් ගත්ත නිවේදන කටයුතු දිගටම කරගෙන ගියා.

**ශ්‍රීනාත්**
ඔබ වේදිකාවටත් සම්බන්ධ වුණා නේද?
**පැතුම්**
මෙල්බන් නුවර ප්‍රදර්ශනය කරපු ආර් ආර් සමරකෝන් මහතාගේ දූවිලි නාට්‍යයේ මම රඟ පෑවා. මෙයට මට ආරාධනා කළේ වෛද්‍ය ඔල්ගා මෙන්ඩිස් මහත්මියයි. ඊට අමතරව සුමේධ රත්නසේකර අධ්‍යක්ෂණය කළ විසංවාදය නමැති කෙටි චිත්‍රපටයේ මම රඟපෑවා.

### මුහුණට මුහුණ

**ශ්‍රීනාත් මද්දුමගේ**

**ශ්‍රීනාත්**
ඉන් පස්සෙ?
**පැතුම්**
ආරාධනා ලැබුණත් කාල වේලාව ප්‍රශ්න නිසා කරන්න බැරිවුණා.

**ශ්‍රීනාත්**
ශ්‍රී ටී වී වැඩසටහන ආරම්භ කළේ මොන හේතුවක් මත ද?
**පැතුම්**
අපට තියෙන්නෙ එකම රූපවාහිනී නාලිකාවක්. හුඟක් අයට සිංහල වැඩසටහන යන වෙලාවට එය නරඹන්න නොහැකි වෙනවා. මේ ගැන හිතපු මට හිතුණා හැම තිස්සෙම ගෙදර ඉඳන් බලන්න පුලුවන් විදිහේ වැඩක් කරන්න. මමත් අනුරුද්ධත් එකතු වෙලා සෙල්ලමට වගේ මේක පටන් ගත්තා. මුලදි අපි හිතුවෙ නෑ මෙය සාර්ථක වෙයි කියලා. නමුත් නරඹපු අයගේ ප්‍රතිචාරය මත මෙය දිගටම කරන්න අපි වෙහෙසුණා. ඒ ගැන මම සතුටුයි.
ඒ එක්කම ශ්‍රී ටී වී අනුග්‍රහයෙන් කරන ලද කලා උළෙලක් මෙල්බන් නුවර වෙසෙන ප්‍රවීණයන් අගැයීම සඳහා කළ සම්මාන උළෙල ගැනත් මම අවංකව සතුටු වෙනවා.

**ශ්‍රීනාත්**
ඔබේ වෘත්තිය ගුවන් විදුලි ශිල්පය ද?
**පැතුම්**
නෑ.. මම උසස් අධ්‍යාපනය කළේ විද්‍යා අංශයෙන්. අවසන් වරට සම්පූර්ණ කළේ විද්‍යාපති උපාධිය. දැනට ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවය කරනවා.

**ශ්‍රීනාත්**
සැඟවුණ තරු වැනි වැඩසටහනක් කරන්න හිතුවෙ ඇයි?
**පැතුම්**
මම 1999 ඉඳලා ප්‍රසංගික වේදිකාවට සම්බන්ධ වෙනවා. එහිදී දැකපු දෙයක් තමයි මෙහේ ඉන්න දක්ෂ අයට අවස්ථාවක් නොලැබීම. ඒව ගේම ඔවුන්ට ඉදිරියට එන්න අවස්ථා අඩු වීම. මේ ගැන හිතපු මම සැඟවුණ තරු ප්‍රසංගය කරලා සැඟවිච්ච තරු ලෝකයට හඳුන්වා දෙන්න උත්සාහ කළා. මම හිතන්නෙ මගේ ව්‍යායාමය සාර්ථකයි කියලයි. එහි දක්ෂතා දක්වපු හුඟක් ශිල්පීන්ට දැන් දැන් ප්‍රසංගික වේදිකා වල තැනක් ලැබෙනවා. ඒ ගැන මම අවංකව සතුටු වෙනවා.

**ශ්‍රීනාත්**
මේ දිනවල ඔබ මොනාද කරන්නෙ?
**පැතුම්**
මේ දවස් වල චැනල් 31 රූපවාහිනී වැඩ සටහනේ ඉරිදා සවස ප්‍රචාරය වන වැඩසටහන මූලිකත්වය ගෙන කරගෙන යනවා. ඊට අමතරව ත්‍රී ට්‍රිපල් ඉසෙඩ් ගුවන් විදුලියේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙක් හැටියට කටයුතු කරනවා. ඒ එක්කම නැෂනල් එත්නික් මල්ටිකල්චරල් බ්‍රෝඩ්කාස්ටිං වැඩසටහන යටතේතමන්ගෙ මව් භාෂාවෙන් ගුවන් විදුලි වැඩ සටහන් කරන්න විවිධ ජාතික තරුණ තරුණියන් එක්රැස් කරමින් යනවා.

**ශ්‍රීනාත්**
මේ ගමනෙදි ඔබට උදව් කළ අය කව්ද?
**පැතුම්**
හුඟක් අය ඉන්නවා. ඒ අතරන් රවි කරව්දෙනිය ඔල්ගා මෙන්ඩිස් බන්දු දිසානායක රෝහණ කරුණාරත්න ඉන්ද්‍රා ගාමිණී ෆොන්සේකා යුවල ධම්මි කටුගම්පොල ප්‍රේමා කටුගම්පොල සුජාතා උපා අබේසිංහ යුවල මේ වෙලාවේ මතක් වෙනවා. මීට අමතරව හුඟකා අය ඉන්නවා. නම් වශයෙන් කියන්න ගියොත් විශාල නම් ලැයිස්තුවක් තියේවි. ඒ හැමෝටම ස්තුතියි. ඒ එක්කම මේ සංවාදය පිළිබඳව සන්නසටත් ඔබටත් ස්තුතිවන්ත වෙනවා.

**ශ්‍රීනාත්**
සන්නස වෙනුවෙන් ඔබගේ අනාගත බලාපොරොත්තු සියල්ලම සාර්ථක වේවායි මම පතනවා.

16 වන පිටෙන්

මගේ නම යෙදී තිබෙනු දක ප්‍රසංගය සංවිධානය කෙරෙන මුල් අවධියේම ලිඛිතව මා එය නිවැරදි කළේ එහි ඇති වැදගත්කම නිසාවෙනි. මේ සියල්ල මඟ හැරීමට තිබුණ හොඳම විකල්පය සමරු කලාපයයි. ශිල්පී ශිල්පිනි කීපදෙනෙකු නිර්මාපකයන්ගේ නම් සඳහන් කරමින් කෘතවේදී වූහ. ඉන් ඒ ශිල්පීන්ටද වටිනාකමක් ඇතිවිය. මා ඉදිරියේදී ම මේ පිළිබඳව සංවිධායකයින්ට අදහස් දක්වූ වෙනත් රසිකයන්ද වීය. ''නෙතඟ නිළුපුල්'' ප්‍රසංගයේදී නිර්මාණකරුවන් හඳුන්වා දීමට වෙනම ක්‍රමයක් නිර්මාණය කර තිබිණ. ''නුඹ ළඟ මං'' ප්‍රසංග වේදිකාවේ දී කළිඳු වීරසිංහ නිර්මාණකරුවන් සිහිපත් කිරීම වෙනුවෙන් විශේෂයෙන්ම ස්තුති වන්ත වීය.

කොළඹ මහජන පුස්තකාල ශාලාවේ පැවැති ගී එකතුවත් දොරට වැඩී අවස්ථාවක දේශනයක් තරමින් ප්‍රවීන සංගීතවේදී රෝහණ වීරසිංහයන් කළ කතාවක් මෙහිදී සිහිපත් වේ.

''ඇතැම් පෞද්ගලික නාලිකාවලින් රසිකයින් ගීයක් ඉල්ලපුවම අසා සිටින අයගේ නම් අසනවා. ගෙදර ඉන්න හැමෝගෙම නම්වලට පස්සෙ ගෙදර ඉන්න බලු කුක්කගෙ නමත් කියවනවා. ඒත් රචකයාගේවත්, තනුව හදපු අයගේවත් නම් සිහිපත් කරන්න වේලාවක් නෑ.'' ලොව නිර්මාණය වී ඇත්තේ නිර්මාපකයින් අතිනි. ලොව පවත්වාගෙන යන්නේ ශිල්පීන් වුවද ලොව ඉදිරියට ගෙන යන්නේ නැවුම් අදහස් ඇති නිර්මාපකයින්ය.

මෙය සංගීතයට නොව, සෑම සියළු අංශයන්ටම පොදු ධර්මතාවයකි.

සිය පළමු උත්සාහය වශයෙන් ''ගී සර ගී රස'' ප්‍රසංගය සාර්ථකයැයි කිව හැකියි. ඉහත ලියැවුණ කරුණු සලකා බලමින් සාමාජිකයින්ගේ අභිවෘද්ධිය සඳහා කටයුතු කරන්නේ නම්, සංගමය දිනෙන් දින තව තවත් සරු ප්‍රතිඵල ලබනු ඇත. එයයි අපගේ ද ප්‍රාර්ථනය.

■